# අපේ උරුමය මෙන්න

වතුර බැස්සවීම සඳහා වැව් ඉවුරේ (දරාඩ) ඉහළ කොටසේ සාදන ලද්දට "බිසෝ කොටුව" යයි කියනු ලැබේ. වර්තමාන කාලයේ විශාල ජලාශවලින් පිටවන ජලය සීමාකිරීමට හෝ සම්පූර්ණයෙන්ම නැවැත්වීමට සාදතිබෙන 'වැල්ව් ටවර්ස්' (Valve - Towers) වලටත් 'වැල්ව් පිට්ස්' (Valve-Pits) වලටත් මේ බිසෝකොටුව සමාන ය. මේ නිසා අවුරුදු 2,100 ටත් පෙර බිසෝකොටු සැදීමෙන් මේ සිංහල ඉංජිනේරුවෝ එහි ආදිම කතෘවරුන්වීමේ ගෞරවය ලැබීමට සුදුස්සෝ වූහ.

"බොහෝ සෙයින් අඩි 30 හෝ 40 ක් ගැඹුරු වූ වැව්වලින් පිටට බසින ජලය ප්‍රමාණ කිරීම එතරම් පහසු කාරණයක් නොවේ. නමුත් සැම කාලවලම සාදන ලද බිසෝකොටුවල මෝස්තරයන්හි දක්නට ලැබෙන සමානකම නිසා ක්‍රි. ව. පෙර තුන්වන ශත වර්ෂයේ හෝ ඊටත් පෙර විසූ සිංහල ඉංජිනේරුවෝ කෙතෙක් දුර එකී කර්මාන්ත තත්වාකාරයෙන් දැන සිටියෝ ද කිවහොත් ඊට පසුව ආ සියල්ලෝම ඒ අනුව මේවා සෑදූ බව ඔප්පුවේ. එහි විස්තර සිතින් පමණක් සිතා බැලිය හැක. ඒ බිසෝ කොටුවේ මෝස්තරය මොස ක්‍රමයකට සෑදූවත් එය සිංහල ඉංජිනේරුවන්ගේ දක්ෂකමෙන් කරණ ලද වික්‍රමයක් වශයෙන් පෙනී යන්නේ ය.

වඩාත් පුදුම එලවන කාරණයක් නම් ඉතා පුරාතණවූ සොරොව්වලත් මේ බිසොකොටු දක්නට තිබීමයි. මෙය සොයාගත්ද පටන් සිංහලයෝ නිර්භයව වැව් සෑදීමට ආරම්භ කළෙන් ලෝකයේ එවැනි කර්මාන්තයන්ගේ අද්විතීය ස්ථානය ඒකාන්තයෙන්ම හිමිවන අයුරු මහගු වැව් වාන් ආදිය සෑදූහ. වැවක ජලය සීමා කිරීමට තවත් උපක්‍රමයක් සාද තිබේ. ක්‍රි. ව. පෙර 19 වන වර්ෂය පමණේ දීත් ජලය ඉහළ නැංවීම යන්ත්‍ර මාර්ගයෙන් කළ බව දැන ගන්ට තිබීම වඩාත් පුදුමයට කාරණයකි. පළමුවන භාතිකාභය රජතුමන් අභය වැවේ ජලය මෙසේ යන්ත්‍ර මාර්ගයෙන් ඉහළ නැංවූ බව කියා තිබේ. මැණීම සහ එල්ල කිරීම අඩංගු කළාවූ ශිල්ප යද පුරාතන සිංහලයෝ පරතෙරට දැන සිටි බවට සැක නැත. වාරි මාර්ගයන්ගෙන් වැඩි කොටසක් තනි තලා ලෙස පෙනෙන භූමි භාගයන්හි සාද තිබේ. දික්වූ ඇලවල් සාද තිබෙන ප්‍රදේශවල ඇති බැස්ම කොපමණ සවල්පද කිවහොත් වර්තමානයේ පාවිච්චි කරණ ඉතා සූක්ෂම උපකරණයන් පවා එකල යොදවන්ට ඇතැයි දැනට පෙනෙන්ට තිබෙන නෂ්ටාවශේෂයන් බලා කිවහැක. නූතන කිසිම උපකරණයකින් නොපැරදිවිය හැකි වූ සියුම් නුවණින්ම විශාල වැකණ්ඩි සහ භූමි නිර්මාණයද සලකුණු කර තිබේ. ඉහතකී කරුණු ගැන කල්පනා කරන විට මේ මහගු කර්තව්‍යයන් සම්පූර්ණ කිරීමට පොළොවේ උස් පහත් ප්‍රමාණයන් දුරප්‍රමාණයන් මැණීමට අදල වූ ශාස්ත්‍ර ක්‍රමයක් ආදී සිහලුන් විසින් ඉතා උසස් අඩියකට පුගුණ කරන්ට ඇතැයි යනකීම විවාද රහිතවේ. වර්තමානයේ මැණීම සම්බන්ධව පිහිටුවා තිබෙන දෙපාතීමේන්තුවට සමාන වන විධිවිධාන ක්‍රිස්තු වර්ෂයේ මුල කාලයේ දි හෝ ඊටත් පෙර ලංකාවේ තිබෙන්ට ඇති බව මුඛ පරම්පරාගත කථාවලින් හා ඉතා පුරාණ සෙල්ලිපි කෑලිවල අනුසාරයෙන් ප්‍රකාශවේ. ඉඩම් මැණීම ගැන ලංකාවේ ඇති වූ පුරාතන දැනීමේ ආරම්භය සෙවීමට ඉහතකී කාරණය විශේෂයෙන්ම ආධාරවේ. තවද ඉතාම සුළු වූ බෑස්මක් වූවත් සොයා ගැණීම සිංහලයන් දැන සිටි බව සිතීම යුක්ති සහගත වේ. පෙර සිටි ගත්කරුවෙක් මේ ගැන මෙසේ කියා තිබේ "සිහලුන් විසින් වැව් අමුණු සෑදීමේදී දක්වන ලද දක්ෂකමේ කීර්තිය කොපමණ දුරට පැතිර ගියේ ද කිවහොත් අටවෙනි ශත වර්ෂයේදී කාශ්මීර රජතෙම (දජය-පිද) ඉංජිනේරුවන් ඉල්වා ලංකාවට හසුනක් එවවේය' යනුයි.

— පාකර්